රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 376

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1987 ජූලි මස 17 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා සභාපතීන් වෙත,

ලියා පදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ද වන,
රජයේ නිලධරයන්ට රාජකාරි නිවාඩු -
ආයතන සංග්‍රහය - XII පරිච්ඡේදය.

ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 13 වන වගන්තිය යටතේ 13:8 ඡේදය වශයෙන් මෙසේ එකතු කරන්න.

"13:8 - වහාම වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන රෝගීන්ට ප්‍රතිකාර කරන ලියා පදිංචි ආයුර්වේද වෛද්‍යවරයෙකුද වන රජයේ නිලධරයෙකු එවැනි රෝගීන්ට ඇත්ත වශයෙන්ම ප්‍රතිකාර කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වන්නේ නම්, ඔහුට මසකට දින 3 කට වැඩි නොවන සේ රාජකාරි නිවාඩු අනුමත කළහැක."

02. මෙම උපදෙස් රාජ්‍ය සංස්ථාවල සේවකයින්ටද බලපාන බව රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් කරුණාකර සටහන් කරගන්න.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.